# ආරක්ෂක අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ගුවන් හමුදාව

## මිල ගණන් කැඳවීමයි (IFB)

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත නැවුම් සහ වියළි ආහාර ද්‍රව්‍ය සැපයීම සහ බෙදාහැරීම සඳහා ප්‍රසම්පාදනය - 2024 වර්ෂය

### කොන්ත්‍රාත් අංකය : SLAF/RA/TB/2024

2024 වසර සඳහා ත්‍රිවිධ හමුදාව වෙත නැවුම් සහ වියළි ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදනය වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) සභාපති විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙනුවෙන් සුදුසුකම්ලත්, ශ්‍රී ලංකාවේ සීමිත සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් ආයතනයක් ලෙස ස්ථාපිත නිෂ්පාදන, තොග හා සිල්ලර මෙහෙයුම්කරුවන්ගෙන් පහත සඳහන් ආහාර කාණ්ඩ යටතේ දක්වා ඇති විද්‍යාපීඨ / මූලික කඳවුරු / කඳවුරු / අනු කණ්ඩ වෙත සැපයීම සඳහා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. සැපයුම් වර්ෂය **2024 ජනවාරි 1** දින සිට **2024 දෙසැම්බර් 31** වන දින දක්වා වර්ෂයක කාලයක් සඳහා වේ.

**1.1 සැපයුම් ස්ථාන සමූහය සහ අනුරූපී කාණ්ඩයන්**

**1.1.1 A කාණ්ඩය - නැවුම් ආහාර අයිතම**

| ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨ/ මූලික කඳවුරු/ කඳවුරු/ අනු කණ්ඩ | | ආහාර අයිතම කාණ්ඩ |
|---|---|---|
| 1.1.1.1. අම්පාර | 1.1.1.14. කොග්ගල | 1. එළවළු, පළතුරු, පොල් සහ කිකිළි බිත්තර |
| 1.1.1.2. අනුරාධපුර | 1.1.1.15. මත්තල | 2. අලුත් මාළු |
| 1.1.1.3. මඩකලපුව | 1.1.1.16. මොරවැව | 3. මස් වර්ග |
| 1.1.1.4. B.I.A. කටුනායක | 1.1.1.17. මීරිගම | 4. කුකුල් මස් (ශුද්ධ කළ) |
| 1.1.1.5. චීන වරාය | 1.1.1.18. මුලතිව් | 5. බේකරි නිෂ්පාදන |
| 1.1.1.6. කොළඹ | 1.1.1.19. පලාලි | 6. දේශීය උදෑසන ආහාර ද්‍රව්‍ය |
| 1.1.1.7. C.T.S. දියතලාව | 1.1.1.20. පාලවි - පුත්තලම | |
| 1.1.1.8. දිගන පහිනාංකය | 1.1.1.21. පිදුරුතලාගල | |
| 1.1.1.9. T.T.S. ඒකල | 1.1.1.22. R.T.S. වන්නි | |
| 1.1.1.10. හිඟුරක්ගොඩ | 1.1.1.23. රත්මලාන | |
| 1.1.1.11. ඉරණමඩු | 1.1.1.24. සීගිරිය | |
| 1.1.1.12. කටුකුරුන්ද | 1.1.1.25. වව්නියාව | |
| 1.1.1.13. කටුනායක | 1.1.1.26. වීරවිල | |

**1.1.2 B කාණ්ඩය - වියළි ආහාර අයිතම**

| ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨ/ මූලික කඳවුරු/ කඳවුරු/ අනු කණ්ඩ | | ආහාර අයිතම කාණ්ඩ |
|---|---|---|
| 1.1.2.1. අම්පාර | 1.1.2.14. කොග්ගල | 1. සහල් |
| 1.1.2.2. අනුරාධපුර | 1.1.2.15. මත්තල | 2. වියළි සලාක |
| 1.1.2.3. මඩකලපුව | 1.1.2.16. මොරවැව | 3. යෝගට් |
| 1.1.2.4. B.I.A. කටුනායක | 1.1.2.17. මීරිගම | 4. කිරි පිටි |
| 1.1.2.5. චීන වරාය | 1.1.2.18. මුලතිව් | 5. කුළුබඩු (ආහාරමය) |
| 1.1.2.6. කොළඹ | 1.1.2.19. පලාලි | 6. තේ කොළ |
| 1.1.2.7. C.T.S. දියතලාව | 1.1.2.20. පාලවි - පුත්තලම | |
| 1.1.2.8. දිගන පහිනාංකය | 1.1.2.21. පිදුරුතලාගල | |
| 1.1.2.9. T.T.S. ඒකල | 1.1.2.22. R.T.S. වන්නි | |
| 1.1.2.10. හිඟුරක්ගොඩ | 1.1.2.23. රත්මලාන | |
| 1.1.2.11. ඉරණමඩු | 1.1.2.24. සීගිරිය | |
| 1.1.2.12. කටුකුරුන්ද | 1.1.2.25. වව්නියාව | |
| 1.1.2.13. කටුනායක | 1.1.2.26. වීරවිල | |

1.2 ලංසු ලේඛනය තුළ එක් එක් ආහාර ද්‍රව්‍ය කාණ්ඩ වල පිරිවිතරයන් සහ විස්තර සපයනු ලැබේ. සපයනු ලබන සියලු ආහාර ද්‍රව්‍ය මානව පරිභෝජනය සඳහා සුදුසු තත්ත්වයේ තිබිය යුතුය. තත්ත්ව ප්‍රමිතීන් ලංසු ලේඛනයේ සහ ලංසු ලේඛනවල අදාළ ඇමුණුම් තුළ නිශ්චිතව දක්වා ඇති අතර ඒ අනුව සියලුම සැපයුම් 1980 අංක 26 දරන ආහාර පනත, එයට සිදු කරන ලද සංශෝධන සහ වරින්වර බලාත්මක කරන ලද රෙගුලාසි වලට අනුකූල විය යුතු ය.

1.3 **ගුවන් හමුදාවේ විද්‍යාපීඨ / මූලික කඳවුරු / කඳවුරු / අනු කණ්ඩ පදනමෙන් ආහාර කාණ්ඩ යටතේ ලංසු ඉදිරිපත් කිරීම.**

1.3.1 එක් එක් විද්‍යාපීඨ / මූලික කඳවුරු / කඳවුරු/ අනු කණ්ඩ පදනමින් සහ ආහාර අයිතම පදනම මත වෙන වෙනම ලංසු ඉදිරිපත් කළ යුතු ය. විද්‍යාපීඨ / මූලික කඳවුරු / කඳවුරු / අනු කාණ්ඩ යටතේ වන ලංසු සඳහා ලංසුකරුවන් එම කාණ්ඩයේ සියලුම අයිතම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කළ යුතු ය. ලංසුකරුවෙකු යම් නිශ්චිත කාණ්ඩයක සියලුම අයිතම සඳහා ලංසු ඉදිරිපත් කිරීමට අසමත් වුවහොත් එය ප්‍රතිචාරාත්මක නොවන ලංසුවක් ලෙස සලකනු ලැබේ.

1.3.2 ප්‍රසම්පාදන අස්ථිත්වයන් විසින් ඇගයීමට ලක් කෙරෙනු ඇති ලංසුකරුවාගේ හැකියාව අනුව ඕනෑම ලංසුකරුවෙකුට එක් කඳවුරකට හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයකට අදාළ ලංසු ඉදිරිපත් කළ හැකි අතර අදාළ අහාර කාණ්ඩ වලට වෙන වෙනම ඉදිරිපත් කළ යුතු ය. ඉන් දෙකක් පහත විස්තර කෙරේ.

**1.3.2.1 A කාණ්ඩය - නැවුම් ආහාර අයිතම සැපයීම**

මෙම කාණ්ඩය ලංසු 136 කින් සමන්විත වන අතර (සැපයුම් ස්ථාන 26 X 4) + (සැපයුම් ස්ථාන 25 X 1) + (සැපයුම් ස්ථාන 7 X 1) = 136, වෙන වෙනම ප්‍රසම්පාදනයක් ලෙස සලකා ඇගයීමේ හා තේරීමේ ක්‍රියාවලිය වෙන වෙනම සිදු කෙරෙනු ලැබේ.

**1.3.2.2 B කාණ්ඩය - වියළි ආහාර අයිතම සැපයීම**

මෙම කාණ්ඩය ලංසු 110 කින් සමන්විත වන අතර (සැපයුම් ස්ථාන 26 X 4) + (සැපයුම් ස්ථාන 6 X 1) = 110, වෙන වෙනම ප්‍රසම්පාදනය ලෙස සලකා ඇගයීමේ හා තේරීමේ ක්‍රියාවලිය වෙන වෙනම සිදු කෙරෙනු ලැබේ.

2. තෝරාගනු ලබන සැපයුම්කරුවන් විසින් කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව එක් එක් විද්‍යාපීඨ / මූලික කඳවුරු / කඳවුරු/ අනු කණ්ඩ වෙත ආහාර ප්‍රවාහනය සම්බන්ධයෙන් වගකිව යුතුය. එක් එක් විද්‍යාපීඨ / මූලික කඳවුරු / කඳවුරු/ අනු කාණ්ඩ පිළිබදව විස්තර ලංසු ලේඛණයෙහි ඇතුලත් කර ඇත.

3. සැපයුම්කරුවන් තෝරා පත්කර ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි ඡේද 3.2 ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු ක්‍රමය (NCB) යටතේ සිදු කරනු ලැබේ. විදේශීය ලංසුකරුවන් හට ලංසු ඉදිරිපත් කළ නොහැක.

4. ලංසු තැබීම සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරු පුවත්පත් දැන්වීම් පලකරන දිනය වන විට ව්‍යාපාර ලියාපදිංචිය සමග ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ආයතනයක්, නිෂ්පාදකයකු, සමාගමක් සහ සීමිත වගකීම් සහිත සමාගමක්, අනෙකුත් වෙළඳ ආයතනයක් (අදාළ ආහාර අයිතම සැපයීමේ නියුතු ආයතනයක්) විය යුතුය. ලංසුකරු අසාධු ලේඛණගත ලංසු කරුවෙකු නොවිය යුතුය.

5. අදාල සුදුසුකම් සනාථ කිරීම කළ හැකි ලේඛණයන් ද ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. පශ්චාත් සුදුසුකම් පරීක්ෂාවේ දී එම සුදුසුකම් ලංසු ලේඛනවල දක්වා ඇති විස්තරාත්මක ක්‍රමවේදය යටතේ ප්‍රමාණාත්මක ඇගයීමකට භාජනය කර එක් එක් අවම ලංසු ඉදිරිපත් කර ඇගයීමට ලක් වු ලංසුකරුවන් වෙත පිරිනමන උපරිම කොන්ත්‍රාත්තු ප්‍රමාණය තීරණය කරනු ලැබේ. මූලික ලංසු ඇගයීම සඳහා පහත දක්වා ඇති අවම සුදුසුකම්වත් සපුරා තිබිය යුතුය.

5.1 ආසන්නම මූල්‍ය වර්ෂ 03 ඇතුලත මූල්‍ය වර්ෂ 02 ක ආහාර සැපයීම් කිරීමේ ක්ෂේත්‍රයෙහි අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම **රුපියල් මිලියන 10** ක් බව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයක් මගින් සනාථ කල යුතුය.

5.2 අවම වශයෙන් **රුපියල් මිලියන 05 ක** ද්‍රවශීල වත්කමක් (අතැති මුදල්, බැංකුවේ ඇති මුදල්, කෙටිකාලීන ආයෝජන සහ ලැබිය යුතු කෙටිකාලීන ණය) ඇති බව (2022/ 2023 මූල්‍ය ප්‍රකාශණ මත පදනම්ව) ඊට අදාළ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මගින් තහවුරු කළ යුතුය. (2022/2023 විගණනය කළ හෝ නොකළ) කෙසේ වෙතත් ලංසුකරුවා ලංසු සමග විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ නම්, පශ්චාත් සුදුසුකම් සනාථ කිරීමේ අදියරේදී **2023. 08. 30** දිනට පෙර විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.

5.3 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත දැනට ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් හෝ මූල්‍ය ආයතන විසින් (මෙම ටෙන්ඩරය සඳහාම) සපයනු ලබන අවම ණය සීමාව **රුපියල් මිලියන 05 ක්** විය යුතුයි.

5.4 අමු ආහාර අයිතමයන් සැපයීම සඳහා, ලංසුකරු විසින් ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම්, ශීත කාමර/ අධි ශීතකරණ සහ ශීත ට්‍රක් රථ පහසුකම් සපුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සඳහන් කළ යුතුය. (එම පහසුකම්හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට/ කුලියට ලබා ගෙන තිබිය හැක.) ඒ සම්බන්ධ අමතර තොරතුරු ලංසු ලේඛණය සමග ලබාදෙනු ලැබේ.

5.5 වියළි ආහාර අයිතමයන් සැපයීම සඳහා, ලංසුකරු විසින් ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම් සපුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සදහන් කළ යුතුය. (එම පහසුකම් හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට/ කුලියට ලබා ගෙන තිබිය හැක.) අමතර විස්තර ලංසු ලේඛනයන් තුළ සපයා ඇත.

5.6 අවසන් වසර 03 ක් තුල වසර 02 ක කාලයක් ආහාර සැපයීම පිළිබඳ අත්දැකීම් තිබිය යුතුය.

6. ලංසු ලේඛණ නිකුත් කිරීම, ලංසු ඉදිරිපත් කිරීම සහ ලංසු විවෘත කිරීමට අදාල දිනය සහ වේලාව පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ලංසු ලේඛන නිකුත් කිරීම ආරම්භ කරනු ලබන දිනය | - | **2023. 06. 21** |
| ලංසු ලේඛන නිකුත් කරනු ලබන අවසාන දිනය සහ වේලාව | - | **2023. 07. 23 ප.ව. 3.00 දක්වා** |
| ලංසු ඉදිරිපත් කල යුතු අවසාන දිනය සහ වේලාව | - | **2023. 07. 24 පෙ.ව. 9.00 දක්වා** |

(ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල - ඒකල)

ලංසු විවෘත කරන ස්ථානය, දිනය සහ වේලාව : (ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල - ඒකල)

| | | |
|---|---|---|
| නැවුම් ආහාර අයිතම | - | **2023. 07. 24 පෙ.ව. 9.30** |
| වියළි ආහාර අයිතම | - | **2023. 07. 24 පෙ.ව. 9.30** |

7. පූර්ව ලංසු රැස්වීම **2023. 07. 06** වන දින **පෙ.ව. 10.00** ට **පළමු මහල, නන්දිමිත්‍ර ශ්‍රවනාගාරයේදී, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,** ලිපිනයෙහි පැවැත්වේ.

8. පහත ඡේද 16 හි සඳහන් ලිපිනයෙන් ලංසුකරුගේ ලිඛිත ඉල්ලීම පරිදි ප්‍රසම්පාදන අංශයේ ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී මගින් ලංසුකරුවන් හට නැවත නොගෙවනු ලබන ගාස්තුව ගෙවීමෙන් පසු ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් ලංසු ලේඛනයන් මිලදී ගත හැක. ආපසු නොගෙවනු ලබන වටිනාකම් මුදල් අමාත්‍යාංශය මගින් තීරණය කර ඇති චක්‍රලේඛන 2016 ජුනි මස 17 වන දිනැති 06/2016 ප්‍රකාරව සිදු කරනු ලැබේ. (එක් එක් ලංසුවට අදාලව ආපසු නොගෙවනු ලබන වටිනාකම් පිළිබඳ විස්තර පහත ඡේද 16 හි සඳහන් ප්‍රසම්පාදන අංශයේ ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී යන ලිපිනයෙන් ලබා ගත හැක.)

9. ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලංසුකරුවන් ලංසු ලේඛනයේ දී ඇති ආකෘති පත්‍ර පමණක් භාවිතා කළ යුතු ය. ඉහත 6 වන ඡේදයේ දක්වා ඇති දිනය සහ වේලාවට පෙර මුද්‍රා තබන ලද **ලංසු පිටපත් දෙකකින්** යුතුව ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් අදාළ ලංසු තැන්පත් කිරීමට තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලිය යුතු ය.

**අවධානය** : ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී
**ලිපිනය** : ගුවන් හමුදාධිපති,
ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල,
ඒකල.

10. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කෙරේ.

11. ඉදිරිපත් කරන ලංසුවෙහි වලංගු කාලය **2024. 03. 31** දක්වා වලංගු විය යුතු ය.

12. **2024. 04. 30** දක්වා වලංගු ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලද ලංසු සුරක්ෂණයක් සහිතව ලංසු ඉදිරිපත් කළ යුතු ය. එම ලංසු සුරක්ෂණ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද (අදාල බැංකුවේ ලිපි ශීර්ෂය සහිතව) කොන්දේසි විරහිතව මුදල් බවට පරිවර්තනය කළ හැකි ලංසු සුරක්ෂණයෙහි මුල් පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණයෙහි වටිනාකම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 ප්‍රකාරව ලංසු ලේඛනයෙහි සඳහන් කර ඇත.

13. සියලුම ලංසුකරුවන් විසින් ලංසු ලේඛනයේ අවශ්‍ය යැයි දක්වා ඇති පරිදි නිෂ්පාදන සහතිකයන් ඉදිරිපත් කළ යුතු වේ.

14. ලංසුකරුවන් විසින් ලංසු ලේඛනයෙහි අමතර තොරතුරු ඉල්ලා ඇති නිශ්චිත අයිතම සඳහා නියැදි ඉදිරිපත් කළ යුතු ය. නියමිත කාල සීමාව තුල නියැදියන් ලබා නොදෙන ලංසුකරුවන්ගේ ලංසු ඉදිරියට ලංසු සැලකිල්ලට නොගන්නා අතර, එම ලංසුව ප්‍රතිචාර නොදැක්වූ ලංසුවක් වශයෙන් සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

15. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට අවශ්‍ය අතිරේක විස්තර වෙතොත් ශ්‍රී ලංකා ගුවන් හමුදා කොළඹ කදවුරේ ප්‍රසම්පාදන අංශයේ මාණ්ඩලික නිලධාරී ප්‍රසම්පාදන (ටෙන්ඩර්) හෝ ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී මගින් ලබාගත හැකි අතර, ඊට අදාල ලංසු ලිපි ලේඛණ පහත ඡේද අංක 16 දක්වා ඇති ලිපිනයේදී කිසිදු ගාස්තු ගෙවීමකින් තොරව **2023. 06. 21** වන දින සිට **2023. 07. 23** වන දින දක්වා සතියේ වැඩකරන දිනයන්හි **පෙ.ව. 9.00 සිට ප.ව. 2.00** දක්වා පරීක්ෂා කළ හැකිය.

16. ඉහත සඳහන් කළ ලිපිනය වන්නේ

**අවධානය** : ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී
**ලිපිනය** : ගුවන් හමුදාධිපති,
ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර, කොළඹ
අංක 140,
සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

**දුරකථන අංකය** : 011-2347694 / 011-2441044 (දිගුව : 23550-23569)
**ෆැක්ස් අංකය** : 011-2441553
**ඊ මේල්** : cpd@slaf.gov.lk/ acpot@slaf.gov.lk

**සභාපති**

**අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව**

**(2024 වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදාවට නැවුම් ආහාර සහ වියළි ආහාර ප්‍රසම්පාදනය)**

**ආරක්ෂක අමාත්‍යාංශය**

**2023/06/21**